# කාර්ය සාධන වාර්තාව

# 2014 වර්ෂය

## තක්සේරු දෙපාර්තමේන්තුව

## මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

# පටුන

**I** කොටස - කළමණාකරණ විශ්ලේෂණ

පෙරවදන---------------------------------------------------3

හැඳින්වීම--------------------------------------------------4

වාර්තාව පරිශීලනය-----------------------------------------4

අප ගැන----------------------------------------------------5

ඉදිරි දැක්ම----------------------------------------5

මෙහෙවර ප්‍රකාශය--------------------------------5

මූලික වගකීම්-------------------------------------5

අරමුණු -------------------------------------------5

මූලික ක්‍රියාදාමයන්--------------------------------6

අභියෝග සහ කළමණාකරණ උපක්‍රම-----------8

වසරේ විශේෂ සිදුවීම් -----------------------------*9*

**II** කොටස - කාර්ය සාධනය

ප්‍රවර්ධන සටහන්

වෘත්තීය නිපුණතා ප්‍රවර්ධනය-----------------------------10

තාක්ෂණික ප්‍රවර්ධනය-------------------------------------14

කාර්ය සාධන මිණුම්දඬු සහ වාර්තාකරණය-------------15

**III** කොටස - මූල්‍යමය සාධනය සහ විශ්ලේෂණය

මූල්‍ය සාධන මිණුම්දඬු සහ විශ්ලේෂණය----------------25

රාජ්‍ය වත්කම් තක්සේරුකරණය-------------------------27

**IV** කොටස - අනුමත මානව සම්පත් සහ ශ්‍රම ශක්තිය

සේවක පිරිස් ගිණුම-----------------------------------28

**V** කොටස - දේපල වෙළඳපල විග්‍රහය

" දේපළ වෙළඳ පොළ විග්‍රහය "– ශ්‍රී ලංකා-----------29

# I කොටස- කළමනාකරණ විශ්ලේෂණ

## පෙරවදන

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙරට සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සුවිශේෂ දයකත්වයක් සපයන බව ප්‍රකට කරුණකි. මෙම දෙපාර්තමේන්තුව මගින් සපයන සේවාවන් අතර පළාත් පාලන ආයතයන්ට අයත් දේපල සඳහා වරිපනම් බදු තක්සේරු කිරීම, රජයේ නිල නිවාස සඳහා කුලී වටිනාකම තක්සේරු කිරීම,රජයේ ඉඩම් බදු දීමේදී බදු මුදල් තක්සේරු කිරීම, රජයට පවරා ගන්නා දේපල වල වන්දි තක්සේරු කිරීම වැනි කාර්යයන්ගේ සිට රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරුකරණය වැනි පුළුල් පරාසයක විහිදෙන්නකි.

2014 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව තුල අප දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම, මෙහෙවර සහ අරමුණු හා වගකීම් මනාව පිළිබිඹු වේ. එය, අපගේ සහ රජයේ සංවර්ධන ක්‍රියාදමයන්හි ඉලක්කයන් ලඟාකර ගැනීම සඳහා අප දැරූ සාමූහික ප්‍රයත්නය සාධනය කර ඇති බවට සාක්ෂි දරයි.

ගරු මුදල් අමාත්‍ය ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන්ගේ සහ ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ මග පෙන්වීම සහ සහයෝගය කෘතඥතා පූර්වකව සටහන් කරමි. අපගේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා, නියෝජ්‍ය ලේකම්තුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය දෙන ලද සහයෝගය අගය කොට සලකමි.

අපගේ සේවාදයකයින් සමඟ සහයෝගයෙන් ඉලක්ක ගත කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා උපරිම සහය දැක්වූ තක්සේරු දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තූතිය පළකරන අතර, ඉදිරියටද රටේ සංවර්ධන ක්‍රියාවලියේදී ඔබගේ සහභාගීත්වය අපේක්ෂා කරමි.

ඡ්. දයාසේන
ප්‍රධාන තක්සේරුකරු
තක්සේරු දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

මෙම 'පාලන හා කාර්‍ය සාධන වාර්තාව' තක්සේරුකරණ හා මූල්‍ය පරිපාලන ක්‍රියාවලිය මුදුන්පත් කර ගැනීමට යොදගත් උපක්‍රම, සැළසුම් උපායමාර්ග , මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ තක්සේරුකරණ හා මූල්‍ය පරිපාලන ක්‍රියාවලිය මුදුන්පත් කර ගැනීමට යොදගත් උපක්‍රම, සැළසුම් උපායමාර්ග , මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් වූ අයවැය සම්පාදන හා අවසන් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් කරන ලද කාර්‍යභාරය හා සම්පත් පරිශීලනය ගෙනහැර දක්වෙන ප්‍රයත්නයයි. 2014 වසර තුල දෙපාර්තමේන්තුව මගින් ඉටුකල කාර්‍යභාරය සවිස්තරාත්මකව සාකාච්ඡා කෙරෙන මෙම වාර්තාව පිළියෙල කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වල අවශ්‍යතාවයන්ට අනුව සහ ඊට ගැලපෙන පරිදි වේ.

**මෙම වාර්තාව පරිශීලනය කරන ආකාරය**

මෙම වාර්තාවෙන් විස්තර වන්නේ 2014 වසරේ දෙපාර්තමේන්තු කාර්‍ය සාධන නිර්ණායකයන්, ප්‍රගතිය හා ඉටුකරනු ලැබූ කාර්‍යභාරය වන අතර , ප්‍රගතිය ඇගයීමේදි අත්කරගත් ප්‍රගතිය වාර්ෂික කාර්‍ය සාධන සැලැස්මේ ඉලක්කගත කාර්‍යභාරය සමග සංසන්දනය කරමින් සාකච්ඡා කෙරේ.

කළමනාකරණ විශ්ලේෂණ

මේ යටතේ අපගේ කාර්‍ය සාධනය පුළුල්ව සහ 2014 වසරේ සම්පත් පරිහරණය පිළිබඳව වූ විස්තර මෙන්ම, අරමුණු සාර්ථක කර ගැනීමෙහිලා ඉවහල් කරගත් උපක්‍රම, කළමනාකරණ අභියෝග හා අපගේ කාර්‍ය සාධනයට බලපෑ බාහිර කරුණු අන්තර්ගත කර ඇත.

- කාර්‍ය සාධනය

  මෙහිදී 2014 වසරේ කාර්‍ය සාධනය අපගේ දිගු කාලීන ඉලක්ක ගත අරමුණු සහ 2014 වසරේ ඉලක්කකර ගත් අරමුණු, ඒ සාක්ෂාත් කර ගැනීමෙහිලා යොදගත් උපාය මාර්ග, එය සපුරාගත් ආකාරය මෙන්ම සපුරා ගැනීමට නොහැකි වූ අරමුණු සහ ඊට හේතු පාදක වූ කරුණුද විශ්ලේෂණය කරමින් සාකාච්ඡාවට භාජනය කර ඇත.

- මූල්‍ය තොරතුරු

  2014 වසරේ මූල්‍ය, ඒකාබද්ධ මූල්‍ය වාර්ථා, මූල්‍ය ප්‍රකාශන සහ ඊට අනුබද්ධ තොරතුරු සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශිලනය කරන්න.

- අනුමත සේවක පිරිස

  දෙපාර්තමේන්තුවේ මානව සම්පත් පිළිබඳ ලුහුඩු විශ්ලේෂණයක් සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශීලනය කරන්න.

- දේපලවෙළඳපල විග්‍රහය

  ශ්‍රී ලංකාවේ දේපල වෙළඳපල ' පිළිබඳ ප්‍රධාන තක්සේරුකරුගේ විග්‍රහය සඳහා මෙම ශිර්ෂය යටතේ පරිශීලනය කරන්න.

## අප ගැන......

### ඉදිරි දැක්ම

"නත්‍ය දේපළ තක්සේරුකරණ සහ කළමනාකරණ විෂයෙහිලා
ගෝලීය ප්‍රමිතීන් පදනම් වූ ප්‍රශස්ත වෘත්තීමය සේවාවන් තුළින්
සමාජ ආර්ථික ප්‍රවර්ධනය"

### මෙහෙවර ප්‍රකාශය

'කාර්යක්ෂම හා ඵලදායි කළමනාකරණ ව්‍යූහයක් තුළින්
තරඟකාරීව මෙන්ම පිරිවැය පිළිබඳ සවිඥාණකව
ශ්‍රී ලංකා රජයට පූර්ණ වෘත්තීමය තක්සේරු හා
දේපල කළමනාකරණ සේවාවන් සැපයීම'

### මූලික වගකීම්

'රාජ්‍ය හා අනුබද්ධ ආයතන උදෙසා තක්සේරු සේවාවන්
හා දේපල කළමනාකරණ උපදේශක සේවාවන්
තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ'

### අරමුණු

'මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු වනුයේ
සේවාදායකයින් වෙත හොඳම කාර්ය්‍ය සාධන ප්‍රමිතීන්
මත පිහිටා සේවාවන් සැපයීමයි'

## මූලික ක්‍රියාදමයින්

දේපළ කළමනාකරණ හා තක්සේරුකරණය සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළුව රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් වර්ගීකරණය කළ හැක.

(අ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා අත්කර ගන්නා විට, එම පනත යටතේ ගෙවිය යුතු වන්දි සඳහා තක්සේරු වාර්තා පිළියෙල කරනු ලබන අතර,හදිසි අත්කර ගැනිමක දී මෙම පනතේ 38 (අ) විධානය යටතේ තත්ත්ව වාර්තා පිළියෙල කිරීම ද සිදු කරනු ලැබේ.

(ආ) ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ යථා කාලයේදී දේපළ අත්කර ගැනීමේ අරමුණින් මුදල් ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීම උදෙසා දේපළ ඇස්තමේන්තු කටයුතු ද කරනු ලැබේ.

(ඇ) පුද්ගලික ගිවිසුම් මත දේපල මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම, ගිණුම් කටයුතු මෙන්ම බදු කාර්යයන් උදෙසා සහ වෙනත් විවිධ කාර්යයන් සඳහා චංචල හා නිශ්චය දේපල තක්සේරු කරනු ලබයි.

(ඈ) රජයේ හා රාජ්‍ය ආයතන වල දේපළ කුළියට දීම සහ පුද්ගලික දේපළ රජයට සහ රාජ්‍ය අනුබද්ධ ආයතන වල පරිහරණය සඳහා අවශ්‍ය වූ විට, ඒ සඳහා කුළී තක්සේරු සපයනු ලැබේ.

(ඉ) කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි දේපළ හැර දිවයිනේ වරිපනම් බදු අය කෙරෙන සියලුම පළාත් පාලන ආයතනයන්ට අයත් දේපළ, වරිපනම් බදු අයකිරීමේ කාර්යය උදෙසා තක්සේරු කරනු ලබන අතර, අතෘප්තිමත් පුද්ගලයින් විසින් වරිපනම් තක්සේරු වලට එරෙහිව ඉදිරිපත්

කෙරෙන විරෝධතාවන් පිළිබඳ නිශ්චය කිරීමේ දී වෘත්තීය සහය දැක්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

(ඊ) තක්සේරුකරණය හා නත්‍ය දේපළ කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක සේවාවන් සැපයීම හා එම අංශයන්හි දැනුම වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය කටයුතු ද මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

(උ) විශේෂඥ සාක්ෂි සැපයීම මගින් අධිකරණයට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට සහය වන අතර, දෙපාර්තමේන්තු නිලධාරීන්, ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින්, ගෙවල් කුලී පණත යටතේ ස්ථාපිත ගෙවල් කුලී මණ්ඩලවල ( කොළඹ මහ නගර සභා සීමා බල ප්‍රදේශය තුළ හැර, අනෙකුත් ගෙවල් කුලී මණ්ඩල වල ) රැස්වීම් වලට සීමා වේ.

(ඌ) රාජ්‍ය භාණ්ඩාගාරයේ ඉල්ලීම මත, රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරු කටයුතු සිදු කරනු ලැබේ.

(ඔ) කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි රජයේ දේපළ වල වාර්ෂික වටිනාකම් ප්‍රධාන තක්සේරුකරුගේ අනුමැතිය සහිතව කොළඹ මහ නගර සභාව විසින් තක්සේරු කරනු ලැබේ.

(ඕ) රජය හා අර්ධ රාජ්‍ය ආයතන වල ගිණුම්කරණ අරමුණු කටයුතු සඳහා වත්කම් තක්සේරු කිරිම.

## අභියෝග හා කළමනාකරණ උපක්‍රම

යෝග්‍ය ක්‍රමවේදයක් අනුගමනය කිරීම තුලින් පූර්ව ක්‍රමවේදයේ පැවති දුර්වලතා අභිබවා සඵලතාවය වැඩිදියුණු කර ගැනීමේ මූලික පරමාර්ථය පෙරදැරිව සමස්ථ දෙපාර්තමේන්තුවේ සියළුම අංශ ආවරණය වන පරිදි, එනම් කළමනාකරණ හා ආයතන කටයුතු වෘත්තිය නිපුණතා මානව සම්පත් සංවර්ධනය හා උසස් වෘත්තිය අවශ්‍යතා පරිපූර්ණ කල හැකි පරිදි සකසන ලද කාර්යක්ෂම හා ඵලදායි ක්‍රමවේදයක් තුලින් පෙර වසරට වඩා ඵලදායි ආකාරයෙන් දෙපාර්තමේන්තුවේ සියළු කටයුතු මෙහෙයවීම විශේෂ සැලකිය හැක.

උපක්‍රමික කළමනාකරණය යටතේ එන "ශදුඅත" (ශක්තිය,දුර්වලතා,අවස්ථා සහ තර්ජන) විශ්ලේෂණය මගින් දෙපාර්තමේන්තුවේ කාර්යය කිරීමේදි ප්‍රධාන අරමුණු ඉටු කරගැනීමෙහිලා ආයතනය සතු ශක්තීන්, දුර්වලතා, බාහිරින් ඇති අවස්ථා හා තර්ජන පිළිබඳ විග්‍රහ කොට වඩා සාර්ථක සංවර්ධන සැලැස්මක් කරා ළඟා වීමට දෙපාර්තමේන්තුවේ සියළු කටයුතු මෙහෙයවීම, මෙහිලා විශේෂ කොට දැක්විය හැක. බලය සැලකීමේදී තක්සේරු කටයුතු වල නියැලෙන සියළු නිලධාරීන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරුකරණය පිළිබඳ විශේෂ උපාධිලත් පිරිසක් වීම විශේෂ සම්පතක් ලෙස දැක්විය හැක.

# II කොටස - කාර්‍ය සාධන

## වෘත්තීය නිපුණතා ප්‍රවර්ධනය

## නිපුණතා සංවර්ධන කේන්ද්‍රය

දැනුම, ආකල්ප හා කාර්යක්ෂමතාවය තේමා කරගනිමින් සහ තිර ජීවන අධ්‍යාපනය තුලින් (Life Long Learning) සේවක අභිමානය යන මූලධර්මයටත් අභිප්‍රේරණය, කාර්යසාධනය ඇගයීම සහ කුසලතා සංවර්ධනය තුලින් සේවක කාර්යක්ෂමතාවය හා කැපවීම යන මූලධර්මද සැලකිල්ලට ගනිමින් 2006 වසරේදී නිපුණතා සංවර්ධන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී.

දෙපාර්තමේන්තුවේ ඉහල කළමනාකරණයේ සිට සහයක ශ්‍රේණිවල කාර්යමණ්ඩලය දක්වා විහිදි යන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම තුලින් වෘත්තීය විශිෂ්ඨත්වය ලඟාකර ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් පුහුණු වැඩසටහන් සංවිධානය හා මෙහෙයවීම සිදුකරයි.

නිපුණතා සංවර්ධන කේක්ද්‍රය විසින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රධාන අංශ දෙකක් යටතේ පහත පරිදි වර්ගීකරණය කල හැක.

- අභ්‍යන්තර පුහුණු වැඩසටහන්
- බාහිර පුහුණු වැඩසටහන්

මෙම වැඩසටහන් ඒවා අයත් විවිධ පරාසයන් අනුව තවදුරටත් වර්ගීකරණය කර ඇති අතර පහත පරිදි වේ.

### ➢ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් (අභ්‍යන්තර වෘත්තීය නිලධාරීන් සහ කළමනාකරණ සේවාවන් සඳහා)

අ. කාර්යස්ථ පුහුණු වැඩසටහන්

ආ.විෂය කේන්ද්‍රකොට ගත් පුහුණු වැඩසටහන් හා වැඩමුළු

ඉ. විභාග ඉලක්ක කොටගත් පුහුණු සැසි සහ වැඩමුළු

ඊ. දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළු

- **බාහිර පුහුණු වැඩසටහන්**

  අ. ග්‍රාම සේවා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්

  ආ. පළාත් ආදායම් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් හා වැඩමුළු

  ඉ. දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ උපාධි අපේක්ෂකයින් සඳහා වෘත්තීය අනුබද්ධ වැඩසටහන්

  ඊ. අත්කර ගැනීමේ නිලධාරීන් සඳහා වන වැඩසටහන් හා වැඩමුළු

  උ. අවශ්‍යතා අනුව විශේෂයෙන්ම සැකසුණු පුහුණු වැඩසටහන්

**පුහුණු වැඩසටහන් හා පුහුණු වැඩසටහන් සඳහා අනුග්‍රහය 2014**

**I. වෙනත් ආයතනවල අවශ්‍යතා අනුව විශේෂයෙන් සැකසුන පුහුණු වැඩසටහන්**

විද්‍යාවේදි දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා තෙවන වසර උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන

මූලික ක්ෂේත්‍ර පරීක්ෂණයේ සිට තක්සේරු වාර්තාව පිළියෙල කිරීම දක්වා වන න්‍යාත්මක මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලිය ආවරණය වන පරිදි දින 10 ක කාලයක් තුල පැවති පුහුණු වැඩසටහනක් උපාධි අපේක්ෂකයින් 65 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

**II.අභ්‍යන්තර නිලධාරීන් සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන්**

දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන

දිස්ත්‍රික් තක්සේරුකරුවන් 65 දෙනෙකු කේන්ද්‍ර කර ගනිමින් ඉඩම් අත්කර ගැනීමේ තක්සේරුකරණ හා නීතිමය පසුබිම පිළිබඳ දැනුම බෙදා දීමේ එක්දින වැඩසටහනක් පවත්වන ලදී.

සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා පුහුණු වැඩසටහන

දැව තක්සේරුකරණයේ න්‍යාත්මක අංශයන් ආවරණය වන පරිදි සහකාර දිස්ත්‍රික් තක්සේරුවන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනකි.

<u>දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන</u>

දිස්ත්‍රික් තක්සේරුකරුවන් කේන්ද්‍ර කර ගනිමින්, තක්සේරු ඒකක කළමනාකරණය, සාමාන්‍ය තක්සේරු සහ විශේෂිත දේපල තක්සේරුකරණය ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩලයට අදාල අභියාචනා යන අංශයන්හි දැනුම පුළුල් කිරීමේ අරමුණින් එක් දින වැඩසටහනක් පවත්වන ලදී.

<u>විශ්‍රාම වැටුප් සඳහා දායකත්වය ගණනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන</u>

විශ්‍රාම වැටුප් සඳහා දායකත්වය ගණනය කිරීම පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පවත්වන ලද එක් දින පුහුණු වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරීනියන් දෙදෙනා සහභාගි කරවන ලදී.

<u>ප්‍රධාන ලිපිකරුවන් සඳහා පුහුණු වැඩසටහන</u>

රාජ්‍ය කළමණාකරණ සහකාර නිලධාරීන්ගේ දෙපාර්තමේන්තු සහ දෙපාර්තමේන්තු චක්‍රලේඛ පිලිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

<u>විශේෂ පුස්තකාල කලමණාකරණ පුහුණු වැඩසටහන</u>

විශේෂ පුස්තකාල කලමණාකරණ එක්දින පුහුණු වැඩසටහන සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශයට අනුයුක්ත සහකාර දිස්ත්‍රික් නිලධාරියෙක් යොමු කරන ලදී.

<u>පොත් තැබීම පිලිබඳ පුහුණු වැඩසටහන</u>

පොත් තැබීම පිලිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා පවත්වන ලද මෙම එක් දින පුහුණු වැඩසටහන සඳහා රාජ්‍ය කලමණාකරණ සහකාර සේවයේ නිලධාරීන් 02 ක් සහභාගි කරවන ලදී

<u>දමිළ භාෂා පුහුණු ප්‍රවීණත්වය පිලිබඳ පුහුණු වැඩසටහන</u>

තක්සේරු සේවයේ නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ රාජ්‍ය කළමණාකාර සහකාර සේවයේ නිලධාරීන් 06 දෙනෙකු දමිළ භාෂා පුහුණු ප්‍රවීණතා පිලිබඳ පුහුණු වැඩසටහනකට යොමු කරන ලදී.

<u>නව සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන</u>

නවක සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් පුහුණු කිරීමේ අරමුණින් ආයතනික ආචාරධර්ම, පරිපාලනමය වගකීම්, දත්ත කළමනාකරණය, සාමාන්‍ය තක්සේරු සහ වරිපනම් තක්සේරුකරණය යන විෂයයන් කෙරෙහි න්‍යායාත්මක දැනුම වර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

## III.විභාග ඉලක්කගත පුහුණු වැඩසටහන්

තක්සේරු සේවයේ IIශ්‍රේණිය II පන්තිය සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් 10 ක් නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙර සූදානම් කිරීමක් වශයෙන් තෙදිනක් පුරා තත්ත්ව වාර්තා පිළියෙල කිරීම, වරිපනම් තක්සේරු, දෙපාර්තමේන්තු පරිපාලනය හා මූල්‍ය, දෙපාර්තමේන්තු ව්‍යුහය, ප්‍රාග්ධන තක්සේරු හා විශේෂ දේපලක් සඳහා සවිස්තරාත්මක තක්සේරු වාර්තා පිළියෙල කිරීම, ව්‍යවහාරික තක්සේරුකරණය, වරිපනම් තක්සේරු විරෝධතා හා ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩලයට අදාල අභියාචනා යන විෂයයන් ආවරණය කෙරෙමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක විය.

## IV.අභ්‍යන්තර නිලධාරීන් සඳහා බාහිර වැඩසටහන්

<u>දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා පශ්චාත් උපාධි වැඩසටහන</u>

ශ්‍රී ජයවර්ධන විශ්වවිද්‍යාලය මගින් පවත්වන මෙම පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සහ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් 8 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

<u>භූගොළීය තොරතුරු පද්ධතිය (GIS ) කාලීන පුහුණු වැඩසටහන පිළිබඳ කෙටි</u>

ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලය මගින් භූගෝලීය තොරතුරු පද්ධතිය පිළිබඳ පවත්වන ලද කෙටි කාලීන පුහුණු පාඨමාලාව සඳහා සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් දෙදෙනෙකු සහභාගි කරවන ලදී.

<u>ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ වැඩමුළුව</u>

ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ මූලික දැනුම ආවරණය වන පරිදි පවත්වන ලද මෙම එක්දින වැඩමුළුව සඳහා දිස්ත්‍රික් තක්සේරුකරුවකු හා ප්‍රධාන ගණකාධිකාරී සහභාගි වන ලදී.

## තාක්ෂණික ප්‍රවර්ධනය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, නූතන ප්‍රවණතා සමග යමින් විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්තියේ අරමුණ සපුරාලීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවාවන් විශ්ව සම්මත හා වෘත්තීය තත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කරන ලදී.

## තත් ප්‍රදේශ පරිගණක ජාල පවත්වාගෙන යාම

දෙපාර්තමේන්තු IT කාර්යමණ්ඩලය විසින් සියළුම පළාත් කාර්යාල වලට අයත් තත් ප්‍රදේශ පරිගණක ජාලයන් නොකඩවා පරිපාලනය සහ උපදේශනයින් සපයමින් මෙහෙයවීම සහ පාලනය සිදු කරන ලදී.

## දෙපාර්තමේන්තු වෙබ් අඩවි සංවර්ධනය

කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රියාවලියක් පවත්වාගෙන යාම අරමුණු කරගෙන තක්සේරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය විවෘත කරන ලදී. සේවා සැපයීමේදී පහසුවෙන් මහජන සම්බන්ධතා පවත්වා ගනිමින් විනිවිද භාවයෙන් යුතු ප්‍රජා සේවාවක් සැපයීම ඉලක්ක කර ගනිමින් මෙය ආරම්භ කරන ලදී. විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ මහජනයාට සැපගිය හැකි අතිකුත් විද්‍යුත් සේවාවන් පිළිබඳ කටයුතු මූලික අදියරෙහි පවතී.

## පරිගණක ගත පුළුල් තක්සේරු ක්‍රමවේදය

තක්සේරු දෙපාර්තමේන්තුවටම ආවේණික සම්මත ආකාරයට නිර්මාණය කරන ලද යෝජිත තක්සේරු ක්‍රමය සඳහා කාර්මික පිරිවිතර සහිතව සියළු මූලික කටයුතු සඳහා අවශ්‍ය ලේඛන පරිගණක ගත කර ප්‍රසම්පාදන ක්‍රියාවලියට සුදුසු පරිදි නිම කළ අතර, එහි මූලික පියවරක් ලෙස ලිපිගොනු හැසිරවීමේ ක්‍රියාවලියට අදාල කාර්යයන් පරිගණක පද්ධතිය ඇසුරින් සකස් කිරීම ආරම්භ කිරීමට නියමිතව ඇත.

දේශීය හා විදේශීය වශයෙන් ප්‍රසිද්ධ කර සියළුම පරිපාලන හා ලේඛන කටයුතු පිළියෙල කොට තක්සේරු ක්‍රමය පිළිබඳ තාක්ෂණික ඇගයීමක් කර මිල ගණන් කැඳවීමට කටයුතු කළ නමුත්, මූල්‍යමය ප්‍රතිපාදන සැලසීමේ ගැටළු හේතුවෙන් එහි ඉදිරි කටයුතු නවතා දැමීමට සිදුවුණි.

## කාර්‍ය සාධන මිණුම්දඩු සහ වාර්තාකරණය

### 1) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ තක්සේරු

2014 වසරේදී දෙපාර්තමේන්තුව විසින් 1950 අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ නිලධාරීයා විසින් 17 (1) වගන්තිය ප්‍රකාර කල යුතු වන්දි ප්‍රදානයන් උදෙසා ඒකක 16 476 ක තක්සේරු වාර්තා නිම කර ඇති අතර, එම පනතේ 38 (අ) විධානය මත කඩිනම් අත්කර ගැනීම් 22,877 ක් උදෙසා තත්ත්ව වාර්තා පිළියෙල කර ඇත.

### 2) යෝජිත අත්කර ගැනීම් උදෙසා දේපල ඇස්තමේන්තු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ කාර්යය වෙනුවෙන් මුදල් වෙන්කර ගැනීම සඳහා 2014 වසර තුල දේපල 1243 ක් ඇස්තමේන්තු කර ඇත.

### 3) අල්ලස් පනත යටතේ තක්සේරු කිරීම

2014 වසර තුල අල්ලස් පනත යටතේ අල්ලස් කොමසාරිස් වෙත තක්සේරු වාර්තා 03 ක් සපයා ඇත.

### 4) මුද්දර බදු සඳහා තක්සේරු

දේපළ 341 ක් සඳහාවූ තක්සේරු කටයුතු නිම කර ඇත.

### 5) රජය සතු දේපළ සඳහා මාසික කුලි හා වෙනත් බදු කුලි තීරණය කිරීම

ආයතන සංග්‍රහයේ xix වන පරිච්ඡේදයේ 5:1 සහ 7:1 යටතේ නියම කළ යුතු ආර්ථික කුලී හා දණ්ඩන කුලී අය කිරීම් උදෙසා කුලී තක්සේරු වාර්තා 4521 ක් වාර්තා කොට ඇත.


### 6) කුලී තක්සේරු කිරීම

2014 වසර තුල විවිධ රාජ්‍ය ආයතනවල පරිහරණය සඳහා දේපල 6067 ක් කුලී වාර්තා පිළියෙල කර ඇත.

**7)** සමාලෝචිත වසර තුල දෙපාර්තමේන්තු නිලධාරීන් ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් දිවයින පුරා ගෙවල් කුලී මණ්ඩල රැස්වීම් වාර 450 ක් සඳහා සහභාගි වී ඇත.

## නිමකළ සාමාන්‍ය තක්සේරු
## වසරින් වසර සහ ඉලක්කගත

| තක්සේරු වර්ගය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| තත්ත්ව වාර්තා | 2343 | 7865 | 6693 | 13818 | 22877 | 30650 |
| ඉඩම් අත්කර ගැනීම | 10478 | 8895 | 8366 | 9320 | 16476 | 19500 |
| ඉඩම් ඇස්තමේන්තු | 998 | 1171 | 1628 | 1423 | 1243 | 1100 |
| ඉඩම් විවිධ | 17782 | 28567 | 29820 | 58563 | 48174 | 63900 |
| අල්ලස් කොමසාරිස් සඳහා | 1 | 2 | 11 | 17 | 3 | |
| මුද්දර ගාස්තු | 167 | 249 | 595 | 472 | 341 | 400 |
| කුලී පුද්ගලික | 4029 | 4872 | 5686 | 6851 | 6067 | 6600 |
| කුලී රජය | 6338 | 4577 | 5925 | 5159 | 4521 | 3800 |





* මුද්දර බදු සහ අල්ලස් කොමසාරිස් වෙත වාර්තා පෙන්නුම් කර නොමැත.

## සාමාන්‍ය තක්සේරු
## 2014ඉලක්ක ගත‹2014නිමකළ›2015අපේක්ෂිත

| | 2014 ඉලක්ක ගත | 2014 නිමකළ | 2015 අපේක්ෂිත |
|---|---|---|---|
| තත්ත්ව වාර්තා | 14000 | 22877 | 30650 |
| ඉඩම් අත්කර ගැනීම් | 10000 | 16476 | 19500 |
| ඉඩම් ඇස්තමේන්තු | 2500 | 1243 | 1100 |
| ඉඩම් විවිධ | 55000 | 48174 | 63900 |
| පුද්ගලික කුලී තක්සේරු | 8000 | 6067 | 6600 |
| රජයේ කුලී තක්සේරු | 6000 | 4521 | 3800 |

සාමාන්‍ය තක්සේරු
2014 ඉලක්කගත < 2014නිමකළ > 2015 අපේක්ෂිත




## 8. වරිපනම් තක්සේරු සාරාංශය

පළාත් පාලන ආයතන, එනම් මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සඳහා වරිපනම් බදු අය කිරීමේ සඳහා 2014 වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් නිම කල වරිපනම් තක්සේරු හා පශ්චාත් වරිපනම් තක්සේරු සැළකිය යුතු ප්‍රමාණයක් වූ අතර එහි සාරාංශයක් පහත දැක්වේ.

### වරිපනම් තක්සේරු
### වසරක් වසරක් පාසා සහ ඉලක්කගත


| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| මූලික සමීක්ෂණ | 263505 | 326933 | 279357 | 243,390 | 184,675 | 290000 |
| අවසන් සමීක්ෂණ | 181361 | 308480 | 243726 | 203,702 | 180,548 | 290000 |



## වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන
## 2014 ඉලක්කගත<2014 නිමකළ> 2015 ඉලක්කගත

| | 2014 ඉලක්කගත | 2014 නිමකළ | 2015 අපේක්ෂිත |
|---|---|---|---|
| මූලික සමීක්ෂණ | 260000 | 184,675 | 290000 |
| අවසන් පරීක්ෂණ | 230000 | 180,548 | 290000 |


වරිපනම් තක්සේරු
2014 ඉලක්කගත<2014 නිමකල>2015 අපේක්ෂිත



## පශ්චාත් වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන කටයුතු


| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන | 2927 9 | 33068 | 32596 | 31133 | 26,290 | 24000 |
| වරිපනම් ප්‍රතිශෝධන ගොඩනැගිලි | 2389 | 3171 | 2152 | 1676 | 2227 | 2100 |
| වරිපනම් අභියාචනා | 6248 | 4993 | 9393 | 10665 | 8451 | 8600 |

පශ්චාත් වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන කටයුතු
වසරක් වසරක් පාසා ඉලක්කගත



## වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන
## 2014ඉලක්කගත‹2014 නිමකළ›2015 ඉලක්කගත

| | 2014 ඉලක්කගත | 2014 නිමකළ | 2015 අපේක්ෂිත |
|---|---|---|---|
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ඉඩම් | 32000 | 26290 | 24000 |
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ගොඩනැගිලි | 3000 | 2227 | 2100 |
| වරිපනම් තක්සේරු අභියාචනා | 12000 | 8451 | 8600 |




## 10.ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ ක්‍රියාකාරකම් ලුහුඬින්

දෙපාර්තමේන්තුවේ නීති අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ 1950 අංක: 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ස්ථාපිත ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත, දේපළ අත්කර ගැනීම යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවූවන් විසින් ඉදිරිපත්කරන අභියාචනා පිළිබඳ ආයතන කටයුතු හා ඒ සඳහා රජය වෙනුවෙන් සාක්ෂි මෙහෙය වන අතර, ඉඩම් අත්පත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ අභියාචනා කළමනාකරණ කටයුතු පහත පරිදිය.


### අභියාචනා කළමනාකරණ ගිණුම
### ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| වසර මුල ඉතිරි | 815 | 749 | 1161 | 2088 | 978 | 1490 |
| වසර තුළ ලද සංඛ්‍යාව | 495 | 401 | 325 | 245 | 429 | 250 |




## අභියාචනා කළමනාකරණ ගිණුම
## ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| අසා නිමකළ | 290 | 221 | 297 | 279 | 256 | 236 |
| ඇසීම සඳහා සූදනම් කළ | 401 | 465 | 435 | 1223 | 1234 | 1763 |
| ඇසීම සඳහා සූදනම් කළ - අසම්පූර්ණ | 111 | 693 | 754 | 831 | 173 | 5 |



## ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය විසින් නිම කරන ලද අභියාචනා සාරාංශය

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| මූලික විභාගයෙන් පසුව අවසන් කළ | 25 | 30 | 143 | 61 | 18 | 50 |
| ඉල්ලා ඉවත්කරගත් අභියාචනා | 64 | 69 | 106 | 52 | 52 | 16 |
| සමථයට පත් කළ | 144 | 67 | 42 | 81 | 114 | 151 |
| ප්‍රතික්ෂේපිත අභියාචනා | 57 | 55 | 96 | 85 | 115 | 117 |




# III කොටස - මූල්‍යමය සාධනය සහ විශ්ලේෂණය

## මූල්‍ය සාධන මිනුම් දඬු සහ වාර්තාකරණය

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|
| **සැබෑ ආදයම** | රු.19,179,283 | රු .22,981,498 | රු .32,585,000 | රු .59,347,000 | රු .101,280,582 | රු .119,450,000 |
| **කල්පිත ආදයම** | රු .247463,213 | රු .25,000,000 | රු .30,000,000 | රු .30,000,000 | රු .30,000,000 | රු .60,000,000 |


**වසරක් පාසා ඉපයූ ආදායම්**



## ඉපයූ ආදායම
## 2014 ඉලක්කගත‹2014 නිමකළ›2015 අපේක්ෂිත

| | 2014 ඉලක්කගත | 2014 | 2015 අපේක්ෂිත |
|---|---|---|---|
| සැබෑ ආදායම | රු . 70,000,000 | රු .101,280,582 | රු .119,450,000 |
| කල්පිත ආදායම | රු . 30,000,000 | රු .30,000,000 | රු .60,000,000 |


**ඉපයූ ආදායම**
**2014 ඉලක්කගත‹ 2014 නිමකළ › 2015 අපේක්ෂිත**



# රාජ්‍ය වත්කම් තක්සේරුකරණය

රජය සතුව පවතින සියළුම ස්ථාවර වත්කම් වල වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය තක්සේරු දෙපාර්තමේන්තුව මත පවරන ලද අතර ඒ සඳහාම පිහිටුවනු ලැබූ රාජ්‍ය වත්කම් තක්සේරු කිරීමේ අංශයෙහි සම්බන්ධීකරණය යටතේ කඩිනම් ව්‍යාපෘතියක් ලෙස මෙම කාර්යය ඉටුකරන ලදී. 2014 වර්ෂය දෙසැම්බර් මාසය වන විට අමාත්‍යාංශ 55 ක් හා අමාත්‍යාංශයක් යටතට නොගැනෙන මැතිවරණ දෙපාර්තමේන්තුව සහ විශේෂ වැය ඒකක යටතේ අග්‍රාමාත්‍ය කාර්යාලය පමණක් තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇත. ඒ අතුරින් දැනටමත් අමාත්‍යාංශ 31 ක්, මැතිවරණ දෙපාර්තමේන්තුව සහ අග්‍රාමාත්‍ය කාර්යාලය යන ආයතන හි දේපල **341** ක සම්පූර්ණ කරන ලද වාර්තා අදාළ අමාත්‍යාංශ වෙත මේ වන විටත් භාරදී ඇත. ඉන් අමාත්‍යාංශ 14 ක දේපල ඒ ඒ ආයතන වලට හිමිකාරීත්වයක් නොමැති බැවින් තක්සේරු කටයුතු සිදු කළ නොහැක.. සමස්ථ ව්‍යාපෘතියෙ ප්‍රගතිය දෙස සලකා බැලුවිට අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව 2012 වර්ෂයෙදී දේපල **1167 (21%)** ක වත්කම් තක්සේරු කර ඇත. ඊට අමතරව 2013 **2631 (47%)** වර්ෂයෙදී ක් ද, 2014 වර්ෂයෙදී **1595 (29%)** ක දේපල ගොනු මේ වන විට අවසන් කර ඇත. තවද අවලංගු කල සහ ඒකාබද්ධ කරන ලද ගොනු **157 (3%)** ක ප්‍රමාණයක් පවතී.

වත්කම් තක්සේරුකරණ වාර්ෂික ප්‍රගතිය - 2013



# IVකොටස - අනුමත මානව සම්පත් සහ ශ්‍රම ශක්තිය

## සේවක පිරිස් ගිණුම

මෙය දෙපාර්තමේන්තුවේ එක් එක් තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ 2014/12/31දිනට සේවයේ නියුතුව සිටි සේවක සංඛ්‍යාව පිලිබඳව වන සාරාංශ ගත ගිණුමකි.

| තනතුර | අනුමත | සිටින | පුරප්පාඩු | වෙනත් |
|---|---|---|---|---|
| ප්‍රධාන තක්සේරුකරු | 01 | 01 | - | |
| අතිරේක ප්‍රධාන තක්සේරුකරු | 01 | - | 01 | |
| නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු – I පන්තිය | 04 | 02 | 02 | |
| අධ්‍යක්ෂ පරිපාලන(ශ්‍රී.ලං.ප.සේ I) | 01 | - | 01 | |
| පළාත් තක්සේරුකරු – II පන්තිය I ශ්‍රේණිය | 15 | 06 | 09 | |
| දිස්ත්‍රික් තක්සේරුකරු – II පන්තිය II ශ්‍රේණිය | 60 | 41 | 19 | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - | |
| ගණකාධිකාර(අභ්‍යන්තර විගණක) | 01 | 01 | - | |
| නීතිනිලධාරී | 02 | 01 | 01 | |
| පරිපාලන නිලධාරී | 02 | 02 | - | |
| සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු I -(III පන්තිය I ශ්‍රේණිය) | 360 | 55 | 04 | |
| සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුII- ( III පන්තිය II ශ්‍රේණිය) | | 301 | | |
| අයවැයසහකාර | 01 | 01 | - | |
| සංවර්ධන නිලධාරී | 43 | 17 | 26 | |
| පරිසංඛ්‍යාන දත්ත සටහන්ක්‍රියාකරු | 01 | 01 | - | |
| රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය I | } 100 | 87 | 13 | |
| රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය I I | | | | |
| රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය I I I | | | | |
| කාර්යාල කාර්ය සහායක - I පන්තිය | 70 | 66 | 04 | |
| කාර්යාල කාර්ය සහායක- IIපන්තිය | | | | |
| කාර්යාල කාර්ය සහායක- IIIපන්තිය | | | | |
| රියැදුරු - Iපන්තිය | } 18 | 13 | 05 | |
| රියැදුරු - IIපන්තියA | | | | |
| රියැදුරු - IIපන්තියB | | | | |
| සංචාරකබංගලා භාරකරු | 02 | 02 | - | |
| **එකතුව** | 683 | 598 | 85 | |

# V කොටස - දේපළ වෙළඳපළ විග්‍රහය

## “දේපළ වෙළඳපළ විග්‍රහය කෙටියෙන් ”

ශ්‍රී ලංකා රජයේ ආර්ථික හා සාමාජීය ප්‍රතිපත්තිය යටතේ සිදු කරන ලද අග නගරය හා අවට ප්‍රදේශ සංවර්ධනය හා නගර අලංකාරය ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් එම ප්‍රදේශ වල සිදුවූ ආර්ථික හා සාමාජීය සංවර්ධනය , විදේශීය ආයෝජයනය මෙම ප්‍රදේශ වල විවිධ සංවර්ධන කටයුතු වල නියලීමට පිටුවහලත් වන ලදී. මෙම කටයුතු මගින් කොළඹ නගරය ශ්‍රී ලංකාවේ වෙළඳ නගරය මෙන්ම එය දේශීය, විදේශීය ජනතාවගේ කොළඹ නගරය දෙසට ඇඳ බැඳ තබා ගැනීමේ හැකියාව වර්ධනය කරන්නක්ද විය.

තවද, ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියේ අවශ්‍යතාවයන් සපුරන පරිදි අවශ්‍යතා අතර සම්බන්ධතාවයෙන් බැදෙන සේ සකසන ලද ආයතනික බැඳීම් ඇති කිරීම විශේෂ ලෙස දැක්විය හැක. දේපල වෙළඳපලේ පවතින වෙනස්වීම් පිළිබඳ තොරතුරු ක්ෂණිකව මහජනතා හෝ ආයෝජකයින් වෙත ගලා යාම සිදු නොවන බැවින් එහි ඇති වන උච්ඡාවචන වලින් නිවරදි ලෙස ලාභ ලබා ගැනීමේ හැකියාව සීමා වී ඇති බැවින් වඩා ඵලදයි දේපළ වෙළඳපලක් ඇති කිරීම සඳහා ක්ෂණිකව යාවත්කාලීන වන තොරතුරු පද්ධතියක් පවතින්නේ නම් එය දේශීය වෙළඳපොල ආර්ථිකයට සුභදයක වනු ඇත.

ඊ.දයාසේන
ප්‍රධාන තක්සේරුකරු
තක්සේරු දෙපාර්තමේන්තුව